www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: වැටුප් හා සේවා කොන්දේසි සඳහා සටන් වැදීමට සමාජවාදී ක්‍රියාමාර්ගයක්

**Sri Lanka: a socialist program to fight for wages and conditions**

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)**
**2008 ජුලි 7**

වරාය, වතුකරය, ප්‍රවාහන, ඛනිජ තෙල්, විදුලි බල, අධ්‍යාපන, සෞඛ්‍ය යන අංශවල සහ පුද්ගලික සමාගම්වල සමිති සිය ගනනක් විසින් කැඳවනු ලැබ ඇති එක් දින වැඩ වර්ජනය ජුලි 10 දා ශ්‍රී ලංකාවේ බොහෝ ක්ෂේත්‍ර ඇනහිටවනු ඇතැයි බලාපොරොත්තු වේ. දැවැන්ත මිල ඉහල නැගීම් වැඩ කරන ජනතාවගේ ජීවන මට්ටම් විනාශ කරමින් පවතින තතු යටතේ, මාසික වැටුප රුපියල් 5000කින් වැඩි කරන ලෙස මෙන් ම බස් හා දුම්රිය ගාස්තු අඩු කරන ලෙසත් උද්ධමනය අනුව ඉහල යන දීමනාවක් ලබා දෙන ලෙසත් වෘත්තීය සමිති ඉල්ලා සිටිති.

ආන්ඩුව මොන යම් හෝ සැලකිය යුතු සහනයක් දීම ප්‍රතික්ෂේප කොට ඇත්තේ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය යුද්ධය මධ්‍යයේ වැටුප් වැඩිවීම් දැරීමට නොහැකි බව අවධාරනය කරමිනි. ආන්ඩුව සම්බන්ධයෙන් ගත හොත්, පසුගිය දෙවසරක කාලය මුලුල්ලේ තවත් ජීවිත දහස් ගනනක් බිලි ගෙන සරනගතයන් ලක්ෂ ගනනක් නිර්මානය කර ඇති යලි ඇරඹූ යුද්ධයේ බර දැරීමට සිදුව ඇත්තේ වැඩ කරන ජනතාවට ය. වර්ජකයන් සම්බන්ධයෙන් “තදින් ක්‍රියා කරන” බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ දැනටමත් අනතුරු අඟවා ඇත.

රාජපක්ෂට අභියෝග කරනවා වෙනුවට, වෘත්තීය සමිති ක්‍රියා කරන්නේ සම්මුතියක් ඇති කර ගත හැකි නම් වර්ජනය අවලංගු කිරීමට තමන් සූදානම් බව අවධාරනය කරමින් ඔහු සමග එකඟතාවක් ඇති කර ගැනීමට යි. ආන්ඩුව සමග දේශපාලනික ගැටුමක් වලකා ගැනීමට අධිෂ්ඨානවත්ව සිටින වෘත්තීය සමිති ජුලි 10 දා කිසිඳු විරෝධතා දැක්වීමක් හෝ රැස්වීමක් සංවිධානය කර නැත. අන් සියල්ලට මත් වඩා වෘත්තීය සමිති නායකයන් උත්සාහ කරන්නේ, සිය ආධිපත්‍යය පවත්වා ගැනීමටත් තම ඉල්ලීම් ඉදිරියට ගෙන යන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් සාමාජිකත්වය තුල මොන යම් හෝ සාකච්ඡාවක් වැලැක්වීමටත් ය.

ආන්ඩුවට එරෙහිව අධිෂ්ඨානවත් උද්ඝෝෂනයක් ගෙන යාම වෘත්තීය සමිති විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම සෘජුව ම ගලා එන්නේ, වර්ගවාදී යුද්ධයට ඔවුන් දෙන සහයෝගයෙනි. වර්ජනය මෙහෙයවන ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය (එන්ටීසී) අනුබද්ධිත ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) 2005 දී රාජපක්ෂ බලයට ගෙන ඒමට මෙන් ම එල්ටීටීඊයට එරෙහි ප්‍රහාර දියත් කරන ලෙස ඔහුව පොලඹවාලීමට ද තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. ආන්ඩුවේ කොටස්කරුවකු නොවුන ද ජවිපෙ, දැවැන්ත ආරක්ෂක වියදම් වෙනුවෙන් සේවාවන් හා රැකියා තව දුරටත් තියුනු ලෙස කප්පාදු කල පසුගිය නොවැම්බරයේ අයවැය ඇතුලු සෑම ප්‍රධාන කාරනාවක දී ම ආන්ඩුවට සහයෝගය දී තිබේ.

ජවිපෙ වර්ජන තීන්දුව වනාහි ජීවන මට්ටම් කඩාවැටීම මගින් දරුනු ලෙස පහර වැදී ඇති මහජනතාව අතර පවත්නා සිය සහයෝගී පදනම් තව දුරටත් ඛාදනය වීම වලකාගැනීමේ මංමුලා සහගත ප්‍රයත්නයකි. රුපියල් 1000ක වැටුප් වැඩිවීමක් ලබා දීමට ආන්ඩුව කර ඇති යෝජනාව ප්‍රතික්ෂේප කරමින් ජවිපෙ ජුලි 4 දා යවා ඇති ලිපියක නව දේශපාලන ඉල්ලීම් කිහිපයක් මතු කර ඇත්තේ, යුද්ධය පිලිබඳ ප්‍රශ්නයෙන් අවධානය ඉවතට යොමු කිරීමේ ප්‍රයත්නයක් ලෙස ය. සමිතිවල වැටුප් ඉල්ලීම් ඉටු කරනු වස් ආන්ඩුවට මුදල් නැත්තේ “දූෂනය” නිසා යයි කියාපන එම ලිපිය වත්මන් දැවැන්ත ඇමති මන්ඩලය හා ජනාධිපති උපදේශකයන් සංඛ්‍යාව අඩු කරන ලෙස මෙන් ම පොලීසිය, මැතිවරන හා අධිකරනය සඳහා ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන ලෙස ද ඉල්ලා සිටී. අවසන් ඉල්ලීමක් ලෙස ජවිපෙ කියා සිටින්නේ, එලඹෙන පලාත් සභා මැතිවරන කල් දමන ලෙස යි. එම මැතිවරනවල දී පක්ෂයේ ඡන්ද බෙහෙවින් පහල බැසීම මුලුමනින් ම පාහේ නිසැක ය.

ජවිපෙ වෘත්තීය සමිති නායක කේ.ඩී. ලාල්කාන්ත සන්ඬේ ලීඩර් පත්‍රයට මෙසේ පැවසී ය: “ජනාධිපතිතුමා මේ ඉල්ලීම් හතර සම්බන්ධයෙන් ක්‍රියා කෙරුවොත් ජුලි 10 වර්ජනය නතර කරන්න පුලුවන්. ආන්ඩුව කියනවා රට යුද්ධයට විශාල මුදලක් වියදම් කරන නිසා වර්ජනය යුද ප්‍රයත්නය කඩාකප්පල් කරනවා

කියලා. නමුත් අප ඉදිරිපත් කරලා තියෙන කොන්දේසි මුදල් ඉතිරි කර ගැනීමට ආන්ඩුවට උදව් වේවි." යුද්ධයට මුදල් වියදම් කල යුතු බව පිලිගැනීම මගින්, ජවිපෙ දැනටමත් වේදිකාව සූදානම් කරන්නේ, වත්මන් වැටුප් ඉල්ලීම්වලට බෙහෙවින් අඩු මට්ටමක සම්මුතියක් මත උද්ඝෝෂනය අවසන් කිරීමට හිලව් වසයෙන් දේශපාලන අල්ලසක් පක්ෂයට ලබා දෙනු ඇති දැවැන්ත පාවාදීමකට යි.

කම්කරුවන් මත කඩාපාත් කෙරෙන ආර්ථික බරට වගකිව යුත්තේ ආන්ඩුවේ දූෂනය නොව වැඩෙන ජාත්‍යන්තර ආර්ථික අර්බුදය සමග ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධය යි. පසුගිය වර්ෂයේ අයවැයේ දී, රාජපක්ෂ ආන්ඩුව 2008 වසර සඳහා ආරක්ෂක වියදම් රුපියල් බිලියන 166 දක්වා, එනම්, ඊට පෙර වසරට වඩා සියයට 20ක දැවැන්ත ප්‍රමානයකින්, ඉහල දැමී ය. මෙම සංඛ්‍යාව රුපියල් බිලියන 750ක් වන ආන්ඩුවේ මුලු ආදායමෙන් සියයට 22කට වැඩි අගයකි. එයට මුදල් වෙන් කරනු ලබන්නේ, සුභසාධන හා සෙසු අත්‍යවශ්‍ය සේවා සහ ඉන්ධන සහනාධාරය ඇතුලු සහනාධාර කප්පාදු කිරීම මගිනි. රාජ්‍ය අංශයේ රැකියා හා වැටුප්වල සිදු කෙරුනේ සුලු වෙනස්කම් කිහිපයක් පමනි. ආන්ඩුවට විරුද්ධ වීම හා වැඩ කරන ජනතාව ආරක්ෂා කිරීම පිලිබඳ පම්පෝරි කතා පවත්වන ගමන් ජවිපෙ මෙම සියලු පිලිවෙත්වලට ඡන්දය දුන්නේ ය.

එක්සත් ජාතික පක්ෂයට (එජාප) සහ නව සමසමාජ පක්ෂයට (නසසප) අනුබද්ධිත සමිති ඇතලු වර්ජනයට එක් වී ඇති සෙසු සමිති එකක් වත් ජවිපෙ වැඩපිලිවෙලට විකල්ප වැඩපිලිවෙලක් ඉදිරිපත් කර නැත. තත්වාරක්ෂක එජාපය බලාපොරොත්තු වන්නේ මිල ගනන් ඉහල යාම සම්බන්ධයෙන් නැගෙන මහජන විරෝධයේ රැල්ලෙන් වාසි ලබා ගැනීමට යි. මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායමක් වන නසසප, යුද්ධයට විරුද්ධ බව කියා පෑවත්, දැන් වචනයක හෝ විවේචනයකින් තොරව, යුද්ධයේ ස්වෝත්තමවාදි ආධාරකරුවකු වන ජවිපෙ සමග අත්වැල් බැඳගෙන තිබේ.

යුද්ධය අවසන් කිරීමේ වැඩපිලිවෙලකින් තොරව, සිය අතිමූලික ඉල්ලීම් වෙනුවෙන් සටන් කිරීමට කම්කරු පන්තිය අපොහොසත් වනු ඇතැයි සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු අඟවා සිටී. ආන්ඩුවට එරෙහිව අරගලයට බට කම්කරු කොටස් -- වරායේ, වතුකරයේ, පාසල්වල, විශ්වවිද්‍යාලවල හා සෞඛ්‍ය ආයතනවල -- යලි යලිත් මුහුන දී ඇත්තේ, රාජපක්ෂගේ යුද්ධයට අභියෝග කරනවා වෙනුවට එය සමග එකඟ වී වැඩ කරන ජනතාවගේ වියදමින් ඔහුගේ ඉල්ලීම්වලට අනුගත වන සමිති නායකයන් විසින් තමන් පාවා දෙනු ලැබීමට යි.

ආසන්න ම නිදසුන නම් මෑත පැවති ගුරු වර්ජනය යි. සැලසුම් කෙරුනු ලෙඩ නිවාඩු දැමීමේ ව්‍යාපාරයට වලකැපීමක් ලෙස, ආන්ඩුව රට පුරා පාසල් වසාදැමීමේ පෙර නොවූ විරූ පියවරක් ගත්තේ, සැබැවින් ම යුද්ධය කඩතුරාවක් ලෙස යොදා ගෙන ය. ගුරු සමිති කිසිදු රැස්වීමක් හෝ විරෝධතාවක් කැඳවා නොතිබුනු බැවින් ඔවුන්ගේ ඉල්ලීම් වෙනුවෙන් පැවති සහයෝගය විනිශ්චය කර ගැනීමේ කිසිදු ක්‍රමයක් නොවී ය.

ජූනි 27 දා සමිති නායකයන් සමග පැවති හමුවක දී, රාජපක්ෂ යලිත් වරක් ප්‍රකාශ කර සිටියේ, සෑම දෙයක් ම යුද්ධයට යටත් කල යුතු බව යි. "මගේ මූලික අභිප්‍රාය වන්නේ නැගෙනහිර කල අයුරින් ම උතුරත් ත්‍රස්තවාදීන්ගේ ග්‍රහනයෙන් මුදවා ගැනීම යි. අපගේ වීරෝධාර සොල්දාදුවන් රට ආරක්ෂා කරන ආකාරයට ම දරුවන් ආරක්ෂා කිරීම සියලු ම ගුරුවරුන්ගේ යුතුකම යි" යයි ඔහු පැවසී ය. රාජපක්ෂට මොන යම් හෝ ආකාරයකින් අභියෝග කරනවා වෙනුවට, සමිති නායකයන් කලේ, ගුරුවරුන් බියගැන්වීම ඉලක්ක කර ගත් ආන්ඩුවේ ලොක්අවුට් වැඩපිලිවෙලක් යුක්තියුක්ත කිරීමේ ඔහුගේ ප්‍රයත්නයට අනුගත වීම යි. ජුලි 10 දා වර්ජනය කැඳවා ඇති නායකයන් ඊට වෙනස් ආකාරයකින් ප්‍රතිචාර දක්වනු ඇතැයි කම්කරුවන් සිතුව හොත් එය ඔවුන් තමන්ව ම රවටා ගැනීමක් වනු ඇත.

යුද්ධයට එරෙහි අධිෂ්ඨානවත් දේශපාලන විරුද්ධත්වයක් නොමැති වීම නිසා ත්‍රස්තයේ හා බිය ගැන්වීමේ වාතාවරනයක් නිර්මානය කිරීමේ හැකියාවක් රාජපක්ෂට ලැබී තිබේ. සිය ආර්ථික තත්වය පිරිහීම හා සේවාවන් කප්පාදුව සම්බන්ධයෙන් විරෝධය දක්වන කම්කරුවන්, ගොවීන් හා ශිෂ්‍යයන් යුද ප්‍රයත්නයට වලකපන්නන් හා "ත්‍රස්තවාදීන්ට උදව් කරන්නන්" ලෙස චෝදනාවන්ට ලක් වී ඇත. ආන්ඩුව සම්බන්ධයෙන් සීමිත විවේචන කරන අය පවා මුහුන දී ඇත්තේ වැඩෙන තර්ජන හෝ ඊටත් වඩා දරුනු අත්දැකීම්වලට යි. නිදැල්ලේ ක්‍රියා කරන මිලිටරියට සම්බන්ධිත ඝාතක කල්ලි විසින් සිය ගනනක් "අතුරුදහන්" කෙරී හෝ ඝාතනයට ලක් කොට ඇත.

දිවයින පුරා ලක්ෂ ගනනක් කම්කරුවන් ජුලි 10 වර්ජනයට එක් වීමට සූදානම්ව සිටී යන කරුන වනාහි වත්මන් ආර්ථික කොන්දේසි ඉවසිය නොහැකි මට්ටමකට සේන්දු වී ඇති බවට දර්ශකයකි. දැන් ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය සියයට 30ට ලඟා වී ඇත. එය වනාහි 2004 දී අගය මෙන් 10 ගුනයකි. ධනවත් අතලොස්සක් හැරුනු කොට, ජනගහනයේ සෑම ස්ථරයක් ම, ඉන්ධන, ප්‍රවාහන හා මූලික ආහාර ද්‍රව්‍ය මිල ගනන් අඛන්ඩව පිම්මේ ඉහල යන තතු යටතේ, සිය වියදම් පියවා ගැනීමේ අරගලයක යෙදී සිටී.

නැගෙන ජාත්‍යන්තර තෙල් මිල ගනන් නිසැකව ම සැලකිය යුතු සාධකයක් වන අතර ම, ශ්‍රී ලංකාවේ උද්ධමනය මේ වන තෙක් දකුනු ආසියාවේ ඉහල ම අගය ය යන කාරනාව මගින් පෙන්නුම් කෙරෙන්නේ, දැවැන්ත හා වැඩෙන යුද වියදම ප්‍රධාන සාධකය බව යි. එල්ටීටීඊයට එරෙහිව මිලිටරිය ගෙන යන අපාලිත යුද්ධයේ ඉන්ධන, උන්ඩ හා බෝම්බ වෙනුවෙන් ගෙවනු වස් බස් හා දුම්රිය ගාස්තු දැවැන්ත ප්‍රමානයන්ගෙන් ඉහල දමනු ලැබ ඇත.

මෙම වර්ජනය වත්මන් සමිති නායකත්වය අතෙහි තැබුව හොත්, එය ඒ හෝ මේ ආකාරයෙන්, නොවැලැක්විය හැකි ලෙස ම පාවාදීමකට ලක් කෙරෙනු ඇත. කම්කරු පන්තියේ මහා වර්ජන ව්‍යාපාරයක් වත්මන් ආන්ඩුවට පමනක් නොව සමස්තයක් ලෙස ධනපති පන්ති පාලනයට ම අභියෝග කරන බව, වත්මන් වර්ජන ව්‍යාපාරයේ යෙදී සිටින සෑම පක්ෂයක් ම අවබෝධ කර ගෙන තිබේ. ඔවුන් එක් දිනකට පමනක් සීමා කොට දෙගිඩියාවෙන් යුතුව වර්ජනය කැඳවා ඇත්තේ ද කිසිදු විරෝධතාවක් හෝ රැස්වීමක් සැලසුම් කර නැත්තේ ද අවසන් මොහොතේ දී වර්ජනය අත්හැර දැමීමට ඉඩ ඇත්තේ ද එබැවිනි. කම්කරු පන්තියේ ඉරනම සම්බන්ධයෙන් කතා පවත්වන ගමන් වෘත්තීය සමිති නායකයන් හා ඒවාට අනුබද්ධිත පක්ෂ උත්සාහ කරන්නේ රාජපක්ෂ ආන්ඩුවට බලපෑම් දැමීමට මෙන් ම තමන්ගේ ම දේශපාලන වරප්‍රසාදිත තත්වයන් වැඩිදියුනු කර ගැනීමට යි.

යලි යලිත් රාජපක්ෂ පැහැදිලි කර ඇත්තේ, වැටුප් ඉල්ලීම් සම්බන්ධයෙන් සීමිත සම්මුතියකට හෝ කිසිදු ඉඩක් නැති බව යි. 2006 දී ඔහුගේ ආන්ඩුව යලි යුද්ධය දියත් කලේ, වර්ජන හා විරෝධතා ඇවිලීමට තුඩු දුන්නා වූ වැඩෙන ආර්ථික අර්බුදයට ඔහුට කිසිදු විසඳුමක් නැති නිසා ම ය. ඔහුගේ සියලු පූර්වගාමීන් මෙන්, රාජපක්ෂ ද වාර්ගික රේඛා ඔස්සේ කම්කරු පන්තිය භේද කරනු වස් දෙමල විරෝධී ස්වෝත්තමවාදය ඇවිලවීමට කිසිසේත් ම පැකිලුනේ නැත. "ජාතික ආරක්ෂාවේ" හා "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" නාමයෙන්, කම්කරු පන්තිය වෙතින් එන ඕනෑම අභියෝගයක් මර්දනය කිරීමේ සිය ප්‍රයත්නයේ දී විවෘත මර්දන විධික්‍රම යොදා ගැනීමට ආන්ඩුව පැකිලෙනු නැත.

කම්කරුවෝ එලඹ ඇති තත්වය පිලිබඳ තක්සේරුවකට එලඹිය යුත්තාහ. සිය මූලික අයිතීන් හා ශිෂ්ඨ සම්පන්න ජීවන මට්ටම් උදෙසා සටන් කිරීමට නම්, කම්කරු පන්තිය යුද්ධය අවසන් කිරීමේ තමන්ගේ ම ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය ය. යුද්ධය නරක දෙයක් බවටත් එය දරුනු දුක් වේදනාවන්ට තුඩු දී ඇති බවටත් පුලුල්ව පැතිරුනු පිලිගැනීමක් පවතින බවට කිසිදු සැකයක් නැත. එහෙත් එය පමනක් ප්‍රමානවත් නොවේ. එකම පන්ති පීඩනයට හා එක සමාන කාලකන්නි ජීවන කොන්දේසිවලට මුහුන දෙන දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් අතර වාර්ගික භේද වර්ධනය කිරීම මගින් ධනපති පන්ති පාලනයට මුක්කු ගැසීමට බොහෝ දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකාවේ සෑම වර්ගයක ම දේශපාලනඥයන් ක්‍රියා කොට ඇත.

කම්කරු පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් සටන් වැදීමේ මොන යම් හෝ ක්‍රියාමාර්ගයක ආරම්භක ලක්ෂ්‍යය වන්නේ සෑම ආකාරයක ම ජාතිවාදය, වර්ගවාදය හා ස්වෝත්තමවාදය ප්‍රතික්ෂේප කිරීම යයි සසප අවධාරනය කර සිටී. තමන් මෙන් ම දරුනු ආර්ථික පීඩනයකට මුහුන දී සිටින නාගරික දුගීන් හා ගම්බද ජනතාව තම නායකත්වය යටතට ආකර්ෂනය කර ගැනීමට කම්කරු පන්තිය සමත් වන්නේ, සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත තමන්ගේ ම පන්ති අවශ්‍යතා සඳහා සටන් වදිනු පිනිස භාෂාව, ආගම හෝ ජනවාර්ගික පසුබිම නොතකා සියලුම කම්කරුවන් ඒකාබද්ධ කිරීම මගින් පමනි.

යුද්ධය අවසන් කරනු වස් ගත යුතු ප්‍රථම පියවර වන්නේ, උතුරෙන් හා නැගෙනහිරෙන් ආරක්ෂක හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම යි. එය එල්ටීටීඊයට ආධාර කිරීමක් හා එබැවින් රාජද්‍රෝහී ක්‍රියාවක් යයි කියමින් කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සියලු ම පක්ෂ එවන් ඉල්ලීමකට එරෙහිව කඩා පනිනු ඇත. තථ්‍ය වසයෙන් ම, ආන්ඩුවට පමනක් නොව එල්ටීටීඊයට ද එරෙහි ඒකාබද්ධ අරගලයක් තුල, දශක දෙකකට වැඩි කලක් තිස්සේ තථ්‍යසමාන මිලිටරි වාඩිලෑමක් යටතේ ජීවත් වන උතුරේ හා නැගෙනහිර වැඩ කරන ජනතාව දකුනේ සිය පන්ති සහෝදරසහෝදරියන් සමග ඒකාබද්ධ කිරීම සඳහා පවතින අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසිය එය යි. එල්ටීටීඊය දෙමල මහජනතාව නියෝජනය කරන්නේ නැත. එය ආරක්ෂා කරන්නේ සිය සිංහල සගයන් සමග වඩා සම තත්වයේ සම්මුතියක් ඇති කර ගැනීමට උත්සාහ කරන දෙමල ධනේශ්වර ස්ථරවල අවශ්‍යතා ය.

ක්ෂනික වැටුප් වැඩිවීම් හා යහපත් සේවා කොන්දේසි සඳහා වන අරගලය, ධනවත් අතලොස්සකට ප්‍රතිලාභ ලබා දෙන ක්‍රමය අවසන් කිරීමේ වඩා පුලුල් සමාජවාදී ඉදිරිදර්ශනයක් සමග සම්බන්ධ කල යුතු ය. වැඩ කරන ජනතාව විසින් නිර්මානය කරනු ලබන ධනය අතලොස්සකගේ ලාභ තර කිරීමට නොව අති මහත් බහුතරයකගේ දැවෙන සමාජ අවශ්‍යතා සපුරාලනු පිනිස යොදා ගනු වස් සමාජය ඉහල සිට පහලට ප්‍රතිසංවිධානය කල යුතු ය. දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වන වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක පදනම මත කම්කරු-ගොවි ආන්ඩුවක් ගොඩනගනු පිනිස සසප කැඳවුම් කර සිටී.

පවත්නා වෘත්තීය සමිති හා පක්ෂ මෙම කිසිදු ඉල්ලීමක් සඳහා සටන් වදිනු නැත. කම්කරු පන්තිය පවත්නා දේශපාලන සංස්ථාපිතයට ගැට ගැසීමට ක්‍රියා කරන මෙම යාන්ත්‍රනයන්ගෙන් පරිපූර්න දේශපාලනික බිඳීමක් අවශ්‍ය ය. ප්‍රථම පියවරක් ලෙස සසප ඉල්ලා සිටින්නේ. වත්මන් උද්ඝෝෂනය වෘත්තීය සමිති නායකත්වයේ අතින් සියතට ගනු වස් කම්කරුවන්ගෙන් ප්‍රජාතන්ත්‍රිකව තෝරා පත් කර ගත් නියෝජිතයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටු ගොඩනගන ලෙස යි. කම්කරුවන්ගේ විශ්වාසනීය නියෝජිතයන්ගේ එවන් කමිටු වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා සපුරාලනු වස් වර්ජනයේ ඉල්ලීම් යලි සැකසිය යුතු ය. මෑතම සමීක්ෂනයකින් පෙන්නුම් කෙරුනේ පිම්මේ ඉහල යන මිල ගනන් හමුවේ වැටුප් දෙගුනයක් දක්වා ඉහල දැමීමක් අවශ්‍ය බව යි. වඩාත් අතිමූලික කාරනාව නම්, මෙම කමිටු රාජපක්ෂ ආන්ඩුවට එරෙහි අරගලය සඳහා අවශ්‍ය දේශපාලන ක්‍රියාමාර්ගය පිලිබඳව හැකි පුලුල්තම සාකච්ඡා ආරම්භ කල යුතු බව ය. මෙම කර්තව්‍යයන් ඉටු කිරීමේ දී, තම පූර්න සහයෝගය දෙන බවට සසප ප්‍රතිඥා දෙයි.

අන් සියල්ලට මත් වඩා, මෙම දේශපාලන අරගලය ඉදිරියට ගෙන යනු වස් කම්කරු පන්තියේ නව මහජන පක්ෂයක් අවශ්‍ය කෙරෙනු ඇත. සසප හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන අතර ලොව වටා සිය සම-චින්තකයන් සමග එක්ව ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සඳහා සටන් වදී. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙසත් අපගේ ක්‍රියාමාර්ගය බැරෑරුම්ව අධ්‍යයනය කොට සසපට බැඳී එය ගොඩනැගීමට ඉල්ලුම් කරන ලෙසත් කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org